විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வது மாடி, ஜன ஜய சிட்டி வளாகம், நாவல வீதி, ராஜகிரிய No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya

311

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/EST02/04/SP(ENG) | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.12..09 |

ප්‍රධාන ලේකම් (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) (බ.ප.)

<u>බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් ආයතනවල බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් ආයතනවල පිළිවෙලින් 2019.01.11, 2021.08.25, 2022.06.08 හා 2023.05.02 දිනයන්හි ඇති වී ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර පළාතේ ඉංජිනේරු කාර්යාංශයට අයත් ආයතන වලට අනුයුක්තව දැනට සේවයේ යෙදී සිටින හා විශ්‍රාමික බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර එම නිවේදනය මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

03. මේ සම්බන්ධයෙන් දැනට සේවයේ යෙදී සිටින හා විශ්‍රාමික නිලධාරීන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි. අදාල අයදුම්පත් එම නිවේදනය සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිළිව පිළියෙල කළ යුතුය.

04. සෑම අයදුම්පත්‍රයක්ම බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මගින් <u>**2024.12.30**</u> දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක 628, 10** වන මහල, ජනජය සිටි ගොනැගිල්ල, නාවල පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

06. අයදුම්පත් කැඳවීමේ නිවේදනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේද පළකර ඇති බව කාරුණිකව සඳහන් කරමි.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

011 2879614
ෆැක්ස් : 0112879512 – Ex: 511
ppscwpest@sltnet.lk



| ලේකම් / செயலாளர் / Secretary | සහකාර ලේකම් (කළමනාකරණ හා ප්‍රතිපත්ති) / உதவிச் செயலாளர் (நிர்வாகம் மற்றும் கொள்கைகள்) / Assistant Secretary (Management & Policies) | සහකාර ලේකම් (විභාග හා බඳවාගැනීම්) / உதவிச் செயலாளர் (பரீட்சைகள் மற்றும் ஆட்சேர்ப்பு) / Assistant Secretary (Examinations & Recruitment) | සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) / உதவிச் செயலாளர் (தாபனம் மற்றும் நிதி) / Assistant Secretary (Establishment & Accounts) | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | |
|---|---|---|---|---|---|
| 011 2879528 | 011 2879610 | 011 2879317 | 011 2879538 | 011 2879517 | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614<br>ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512<br>ඊ-මේල් / ஈமெயில் / E-Mail: ppscwpse@sltnet.lk |

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් ආයතනවල**
**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් ආයතනවල පිළිවෙලින් 2019.01.11, 2021.08.25, 2022.06.08 හා 2023.05.02 දිනයන්හි ඇති වී ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ඉංජිනේරු කාර්යාංශයට අයත් ආයතන වලට අනුයුක්තව දැනට සේවයේ යෙදී සිටින හා විශ්‍රාමික බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් කැඳවන අවසාන දිනය : **2024 දෙසැම්බර් මස 30**

02. **බඳවා ගන්නා ආකාරය**

I. 2020.07.24 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 10.3.3 ඡේදයට අනුව උපලේඛණ 06හි සඳහන් නිර්ණායක යටතේ පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල අනුව හා අදාළ සෙසු අවශ්‍යතා සපුරා ඇති බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බස්නාහිර පළාතේ ඉංජිනේරු කාර්යාංශයට අයත් ආයතනවල බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී විශේෂ ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

03. **මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 - MN- 7 2016 හි 04 වන වැටුප් පියවර
රු.41,580- 11 x 755 –18 x 1030 –68,425/-

04. **සුදුසුකම්**

**පුරප්පාඩු ඇති වූ දිනට පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.**

I. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම. (බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.06.01 දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. (බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 08 ඡේදයේ සටහන)

05. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද<br><br>අදාළ මූලික සුදුකම ඉක්මවා සපුරා ඇති සක්‍රිය හා සතුටුදායක සේවා කාලය (පාලන චක්‍රලේඛ 01/2022 අනුව ලකුණු ලබාදෙනු ලැබේ) | 50 | අදාළ නොවේ |
| • අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලා සඳහා - ලකුණු 15<br>(අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලා නොමැති බැවින් සිවිල් ක්ෂේත්‍රයට අදාල ඩිප්ලෝමා මේ සම්බන්ධයෙන් අදාල කර ගැනේ )<br>• සහතික පත්‍ර පාඨමාලා සඳහා - ලකුණු 10<br>• දේශීය හා විදේශීය සම්මාන / සහතික පත්‍ර - ලකුණු 05<br>• ලබාගත් ප්‍රශංසා හා ඇගයීම් ආදිය - ලකුණු 05<br>• ආයතනික කටයුතු සම්බන්ධයෙන් වූ දැනුම - ලකුණු 03<br>(ආයතන සංග්‍රහයේ VIII, XII, XIV හා XLVIII පරිච්ඡේද පිළිබඳ ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා වන වාචික පරීක්ෂණය)<br>• වෘත්තීය හැකියාව - ලකුණු 07<br>වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක ජල සම්පාදන, පල්දෝරු හා විදුලි පරිපථ මාර්ග සැලසුම් පිළියෙල කිරීම පිළිබඳව ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා වන වාචික පරීක්ෂණය<br>සහ<br>වැඩබිම් පරීක්ෂා වලට සහභාගී වීම හා මිනුම් ගැනීම සිදු කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම<br>(ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිත ලියවිල්ලක් මගින් තහවුරු කළ යුතු වේ) | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

06. බස්නාහිර පළාතේ ඉංජිනේරු කාර්යාංශයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය.

07. සෑම අයදුම්පත්‍රයක්ම ඔබගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2024.12.30** දිනට පෙර හෝ ඊට පෙර ලැබෙනසේ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" බස්නාහිර පළාතේ ඉංජිනේරු කාර්යාංශයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය "**යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

08. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

09. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.gov.lk යන නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

2024 දෙසැම්බර් මස ....09

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී

විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (සේවා පළපුරුද්ද සහ කුසලතාවය මත)

(නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)

1. නම (මුලකුරු සමග) : ..........................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම : ..........................................................................
3. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව හා එහි ලිපිනය : ...........................................

...............................................................................................................................

4. වර්තමාන සේවා ස්ථානය හා එහි ලිපිනය :...........................................................

...............................................................................................................................

5. සේවය ස්ථිර කරන ලද දිනය : ..................................................................................
6. දුරකථන අංකය : රාජකාරි - .................................... පෞද්ගලික - ..............................
7. ස්ත්‍රී / පුරුෂ භාවය : ..................................................................................................
8. ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................................
9. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද දිනය : ..............................
10. බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I ශ්‍රේණියට තනතුරට කරන ලද දිනය : ................

පත්වීම් ලිපියේ යොමු අංකය හා දිනය : ......................................................................

11. පහත සඳහන් පුරප්පාඩු ඇති වූ දිනට බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී I ශ්‍රේණියේ සේවා කාලය :

| පුරප්පාඩු ඇති වූ දිනය | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| 2019.01.11 | | | |
| 2021.08.25 | | | |
| 2022.06.08 | | | |
| 2023.05.02 | | | |

12. වෘත්තීය සුදුසුකම්

| අනු අංකය | අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලා හෝ සිවිල් ක්ෂේත්‍රයට අදාල ඩිප්ලෝමා සහතිකය | වලංගු දිනය |
|---|---|---|
| 01 | | |
| 02 | | |

13. සහතික පත්‍ර පාඨමාලා ( සැලසුම් ක්ෂේත්‍රයට අදාල)

| අනු අංකය | සහතික පත්‍ර පාඨමාලාව | වලංගු දිනය |
|---|---|---|
| | | |
| | | |

14. අදාල ක්ෂේත්‍රයේ දේශීය විදේශීය සම්මාන / සහතික පත්‍ර

| අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති සම්මානය / සහතික පත්‍රය | සම්මානයේ / සහතික පත්‍රයේ නම | වලංගු දිනය |
|---|---|---|
| ලබා ඇති දේශීය සම්මාන | | |
| ලබා ඇති විදේශීය සම්මාන | | |
| ලබා ඇති සහතික පත්‍ර | | |

15. අදාල ක්ෂේත්‍රයේ වෘත්තිය හැකියාව සනාථ කිරීමට රාජකාරි ඉටු කිරීමේදි දක්වන ලද සක්‍රිය දායකත්වය පිළිබඳ විස්තර :

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

16. 2019.01.11 , 2021.08.25, 2022.06.08 හා 2023.05.02 දිනට ( අදාල නොවන වර්ෂ තනි ඉරකින් කපන්න) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත / නැත

16.1 වැටුප් වර්ධක උපයා ගෙන ඇත / නැත ....................................

16.2 විනය දඬුවම් ලබා ඇත / නැත ..........................................

වැටුප් වර්ධක උපයා ගෙන නැති නම් / විනය දඬුවම් ලබා ඇති නම් ඊට හේතු දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

17. 2019.01.11 , 2021.08.25, 2022.06.08 හා 2023.05.02 දිනට පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනය දඬුවම් ලබා ඇත / නැත :......................................................

විනය දඬුවම් ලබා ඇති නම් ඊට හේතු දක්වන්න. ......................................................................

..........................................................................................................................................

18. 2019.01.11 , 2021.08.25, 2022.06.08 හා 2023.05.02 දිනට ( අදාල නොවන වර්ෂ තනි ඉරකින් කපන්න) ට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇත / නැත ....................................

ඇත නම් ඊට හේතු දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

19. අයදුම්කරුගේ සහතිකය

මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය බවත්, මෙම සම්මුඛ පරීක්ෂණය පිළිබඳව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.07.24 දිනැතිව අනුමත කරන ලද 2013.06.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ 10.3.3 ඡේදයට මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වෙමි. තවද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීති වලට සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත උසස් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..........................................................

දිනය : ...........................          නිලධාරියාගේ අත්සන

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ (සැලසුම් ) I ශ්‍රේණියේ නිලධාරි / නිලධාරිනි ................................................................................ මහතා / මහත්මිය....................... දින සිට මෙම කාර්යලයේ සේවය කරන බවත්, .................................දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සැලසුම්) I ශ්‍රේණියට උසස් වී ඇති බවත්, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.07.24 දිනැතිව අනුමත කරන ලද බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ 10.3.3 ඡේදයට අනුව සියළුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනට විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

..................................................

දිනය : ..........................          ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

21. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත නිර්දේශය හා එකඟවෙමි / නොවෙමි.

....................................................

දිනය : ............................          දෙපාර්තමේන්තු ප්‍රනියාගේ අත්සන හා නිලමුද්‍රාව

22. **අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

ඉහත නිර්දේශය සමග එකඟ වෙමි./නොවෙමි.

.........................................................

දිනය : ..............................                                        අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව

23. **ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

ඉහත නිර්දේශය හා එකඟවෙමි / නොවෙමි

.........................................................

දිනය : ..................................                                        ප්‍රධාන ලේකම්ගේ අත්සන හා නිලමුද්‍රාව